සියලු හිමිකම් ඇවිරිණි / All Rights reserved

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව Provincial Department of Education NWP වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව Provincial Department of Education - NWP

# වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
# Provincial Department of Education - NWP

45 S I

## පළමු වාර පරීක්ෂණය - 13 ශ්‍රේණිය - 2019
## First Term Test - Grade 13 - 2019

විභාග අංකය .............................

## බෞද්ධ ශිෂ්ටාචාරය I

කාලය පැය දෙකයි

**වැදගත්**

- **සියලු ම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.**
- **1 සිට 50 තෙක් එක් එක් ප්‍රශ්නයට 1,2,3,4,5 යන පිළිතුරුවලින් නිවැරදි හෝ වඩාත් ගැළපෙන පිළිතුර තෝරා එය සලකුණු කරන්න.**

1. විවිධ ආකාරයෙන් සමාජය තමන් වෙත නතු කර ගැනීම සඳහා බමුණන් විසින් බොහෝ ක්‍රියා මාර්ග ගන්නා ලදී. ඔවුන් ඒ ක්‍රියා මාර්ග සඳහා යොමු කරනු ලැබූයේ බ්‍රාහ්මණ පූජක පිරිස විසිනි. විශේෂයෙන් තම මතවාදයන් සමාජ ගත කිරීම සඳහා ඔවුන් යොදාගත් ප්‍රධානතම ක්‍රියාකාරකම වූයේ,
(1). යාග කරවීමයි (2). වේදය ඉගැන්වීමයි
(3). රාජ්‍ය අනුශාසකත්වය ලබා ගැනීමයි (4). දානය පිළිගැනීමයි
(5). කාන්තාව පහත් කොට ක්‍රියාකිරීමයි

02. **'සත්වයා' හා ලෝකය සර්වබලධාරි දෙවියකු විසින් මවා පාලනය කරනු ලැබේ** යන ප්‍රකාශයෙන් කියවෙන ආගමික ඉගැන්වීම් හඳුන්වනු ලබන්නේ,
(1) ශාස්වතවාදය යනුවෙනි (2) අහේතු අප්‍රත්‍යයවාදය යනුවෙනි (3) නියතිවාදය යනුවෙනි
(4) පරිණාමවාදය යනුවෙනි (5) ඊශ්වර නිර්මාණවාදය යනුවෙනි

03. වෘක්ෂලතා, කෘමීන්, පක්ෂීන්, සිව්පාවුන් අතර ඒ ඒ ජාතිවලට අයත් ලිංග විශේෂතා ඇතත් මිනිසුන් අතර එවැනි විවිධත්වයක් දැකිය නොහැකි බව බුදුරජාණන් වහන්සේ වාසෙට්ඨ සූත්‍රයේදී දේශනා කොට ඇත. මෙමගින් තහවුරු කිරීමට උත්සහ ගෙන ඇත්තේ,
(1) සත්ව ජාතීන්ට වඩා මිනිසා උසස් වන බවයි.
(2) සත්ව ජාතීන් අතර පවත්නා ලිංග නානත්වය මානව වර්ගයා අතරට ද පැමිණ චතුර් වර්ණය ප්‍රභවය වූ බවයි.
(3) චතුර් වර්ණය පදනම් කරගෙන කරනු ලබන වර්ගීකරණය යුක්ති සහගත නොවන බවයි.
(4) සත්ව සංහතිය අතර මෙන්ම මානව සංහතිය තුළ ද ස්වජාතිමය ලිංග විශේෂතා ඇති බවයි.
(5) උපත පදනම් කරගෙන මිනිස් වර්ගයා උස් පහත් වශයෙන් වර්ග කළ හැකි බවයි.

04. බ්‍රාහ්මණ සම්ප්‍රදාය බුද්ධ කාලීන භාරතීය කාන්තාවන්ගේ සාමාජික, ආර්ථික. දේශපාලනික මෙන් ම ආගමික නිදහස ද අහිමි කොට තිබූ බව වෛදික සාහිත්‍යයෙන් මෙන්ම බෞද්ධ මූලාශ්‍රයන්ගෙන් ද පැහැදිළි වේ. එහෙත් ආධ්‍යාත්මික විමුක්තිය සඳහා ස්ත්‍රීත්වය බාධාවක් නොවන බව බුදුසමය පෙන්වා දෙයි. ඒ බව තහවුරු වන්නේ,
(1) ථේරීගාථාවල දැක්වෙන භික්ෂුණීන්ගේ ප්‍රකාශවලිනි.
(2) මවක් වශයෙන් වන්දනීය තත්වයක් කාන්තාවට හිමිකර දීමෙනි.
(3) බිරිඳක් වශයෙන් කාන්තාවගේ අයිතිවාසිකම් තහවුරුවී තිබීමෙනි.
(4) බිරිඳ ස්වාමිපුරුෂයාගේ හොඳ ම මිතුරිය ලෙස හඳුන්වා දීමෙනි.
(5) කාන්තාව ඒ ඒ තන්හිදී විචක්ෂණශීලී ව ක්‍රියාකරන බව බුදුරදුන් දේශනා කිරීමෙනි.

05. ශතක සාහිත්‍යවල දක්වෙන ආකාරයට දිඹුල් ගසේ මල් පිපුණත්, සුදුවන් කපුටන් දැකිය හැකි වුවත් මත්ස්‍යයන්ගේ පිය සටහන් ජලයේ දැකිය හැකි වුවත් ---------------
(1) කාන්තාව විශ්වාස කළ නොහැකිය.
(2) කාන්තාව වරදෙහි බැඳෙන එක වැළක්විය නොහැකිය.
(3) කාන්තාවට කිසිවිටකත් පිරිසිදුව ජීවත්විය නොහැකිය.
(4) කාන්තාවගේ සිත විශ්වාස කළ නොහැකිය.
(5) කාන්තාවගේ වචනය විශ්වාස කළ නොහැකිය.

06. භාරතීය ආගමික පරිසරය ප්‍රධාන වශයෙන් ආගමික සන්ධාර දෙකක් යටතේ විකාශය විය. ඒ බ්‍රාහ්මන හා ශ්‍රමණ වශයෙනි. බුදුදහම ඇතිවීමත් සමග ශ්‍රමණ සම්ප්‍රදාය පසු කාලයේ බාහිරක ශ්‍රමණ හා ශාක්‍ය පුත්‍ර ශ්‍රමණ වශයෙන් වර්ගීකරණයකට ලක්විය. මේ දෙක අතර ද වෙනස්කම් ගණනාවක් දක්නට ලැබුණි. ඒ අනුව ශාක්‍ය පුත්‍ර ශ්‍රමණ සම්ප්‍රදායේ සුවිශේෂී ලක්ෂණයක් වූයේ,
(1). සියලු ශ්‍රාවක පිරිස් පිණ්ඩපාතයෙන් යුතුව කටයුතු කිරීම.
(2). සියලු ශ්‍රාවක පිරිස් සංචාරක ජීවිතයකට යොමු කිරීම.
(3). කාමසුඛල්ලිකානුයෝගයට හා අත්තකිලමතානුයෝගයට ජනතාව යොමු කිරීම.
(4). සමාජය තුළ ඇති-නැති පරතරය සම්පූර්ණයෙන් දුරුකිරිමට කටයුතු කිරීම.
(5). අන්තගාමී නොවී මධ්‍යස්ථ ප්‍රතිපදාවකට අනුගතව කටයුතු කිරීම.

07. බුදුරදුන් පහළ වන වකවානුවේදි භාරතීය ආගමික පරිසරය විවිධ ආගමික මතවාදවලින් ගහණ විය. මිනිස්සු මෙම ආගමික ඉගැන්වීම්වලට ලක්ව අවුලෙන් අවුලට පත්ව සිටියහ. පුබ්බේකතහේතුවාදය එසේ පැවැති දර්ශන වාදයන්ගෙන් එකකි. එම දර්ශන වාදය ඉදිරිපත් කළ අය අතර ප්‍රමුඛයන් වන්නේ.
(1). ජෛනයින්ය. (2). ආජීවකයින්ය. (3). පරිබ්‍රාජකයින්ය. (4). තාපසයින්ය (5) ජටිලයින්ය.

08. නියති, සංගති, භාව යන කරුණුවලින් සත්වයා පරිණාමයට පත්වන බව උගනවනු ලැබූ ශාස්තෘවරයා වූයේ
(1) පූර්ණ කාශ්‍යප ශාස්තෘවරයාය. (2) අජිතකේසකම්බලී ශාස්තෘවරයාය.
(3) පකුධ කච්චායන ශාස්තෘවරයාය. (4) මක්කලී ගෝසාල ශාස්තෘවරයාය.
(5) සංජයබෙල්ලට්ඨිපුත්ත ශාස්තෘවරයාය.

09. සමරසේන රජයේ රැකියාවක් කළ ද අමුතු ම ගති පැවැතුම්වලින් යුක්ත අයෙකි. ඔහු කිසිවිටකත් පින් පව් මෙන් ම හොඳ නරක ද ඒවාට අනුරූපිව පවත්නා විපාක ද නොපිළිගනී. සමරසේනගේ අදහස්වලට සමානකම් දක්වන දහමක් බුද්ධ කාලයේ ඉදිරිපත් කරනු ලැබුවේ,
(1). සංජය බෙල්ලට්ඨිපුත්ත ශාස්තෘවරයාය. (2). පූර්ණ කාශ්‍යප ශාස්තෘවරයාය.
(3). ආලාර කලාම ශාස්තෘවරයාය. (4). නිගණ්ඨනාථ පුත්ත ශාස්තෘවරයාය.
(5). පකුධ කච්චායන ශාස්තෘවරයාය.

10. ෂට් ශාස්තෘන් බහුතරයකගේ ඉගැන්වීම් අතර කිසියම් එකගතාවක් පවත්නා නමුදු ඇතැම් ඉගැන්වීම් එම ශාස්තෘවරයාට ම අනන්‍ය වේ. ඒ අනුව පකුධ කච්චායන ශාස්තෘවරයාට ම අනන්‍ය වූ මූලික ඉගැන්වීමකි.
(1) නියතිවාදී දහමක් ඉදිරිපත් කිරීම. (2) පරම අවිහිංසාවාදී දහමක් ඉදිපත්කිරීම.
(3) සප්තකාය පදාර්ථවාදී දහමක් ඉදිරිපත් කිරීම. (4) ආත්මවාදී දහමක් ඉදිරිපත් කිරීම.
(5) සංසයවාදී දහමක් ඉදිරිපත් කිරීම.

11. භාරතය විශාල භූමි ප්‍රදේශයකට හිමිකම් කියූ රටක් බව ඉතිහාසගත කරුණු අධ්‍යනයේදී පැහැදිලි වේ. මෙය ක්‍රි. පූ. අටවන සියවස වන විට පෞර රාජ්‍යක් ලෙස පැවැතුනි. එකල බලයේ සිටි නිචක්ෂු නම් පාලකයාගේ වකවානුවේ එම පෞර රාජ්‍යයේ බිඳවැටීම සිදුවිය. එසේ බිඳවැටීමට බලපෑ ප්‍රධානතම හේතුව වූයේ,

(1). අනාර්ය ජන කොට්ඨාසයෙන් එල්ල වූ පහරදීමයි.
(2). සංස්කෘතික වශයෙන් ගොඩනැගෙමින් පැවැති විවිධත්වයයි.
(3). රාජාණ්ඩු සංකල්පය සමාජගතව පැවැතීමයි.
(4). අගනුවර වෙනස් කිරීම නිසා ප්‍රාදේශීය පාලකයන් ස්වාධීනව කටයුතු කිරීමට පෙළඹීමයි.
(5). බ්‍රාහ්මණ ආධිපත්‍යය ක්‍රමයෙන් ගිලිහීයාමයි.

12. ශාසන ඉතිහාසය සම්බන්ධ වැදගත් සිදුවීම් ගණනාවක් සිදු වූ රාජ්‍යයක් ලෙස කාසි ජනපදය සැලකේ. එරට දී ඇති වූ සිදුවීම් අතර සුවිශේෂී සිදුවීමක් ලෙස සැලකිය හැකිවන්නේ,

(1) තුන්බෑ ජටිලයින් දමනය කිරීම. (2) දෙවියන් උදෙසා මංගල සූත්‍රය දේශනා කිරීම.
(3) සෝණදණ්ඩ බමුණා බුදුරදුන් මුණගැසීම. (4) පස්වග තවුසන්ට දම්සක් පැවැතුම් සූත්‍රය දේශනා කිරීම.
(5) බුදුරදුන් පස්වන වස්කාලය ගතකිරීම.

13. බුද්ධ කාලයේ රෙදිපිළි කර්මාන්තය සම්බන්ධව------------------------ ප්‍රචලිතව පැවැති ප්‍රධාන වෙළඳ නගරයකි.
(1) පාවානුවර (2) කුසිනාරානුවර (3) බරණැස්නුවර (4) රජගහනුවර (5) සැවැත්නුවර

14. බ්‍රාහ්මණ ස්වධර්මවලට අනුව කෘෂිකර්මාන්තය ක්ෂත්‍රිය වර්ණයට පමණක් අනන්‍යවූ ජීවන වෘත්තියක් විය. නමුත් පසුකාලය වනවිට එක්තරා වෘත්තියකට පමණක් සීමා නොවී සෙසු කුලීන වර්ණයන් ද කෘෂිකර්මාන්තයේ නියලුන බවට තොරතුරු සූත්‍රපිටකය තුළින් හඳුනාගත හැකි ය. ඒ අනුව කෘෂිකර්මාන්තයේ නියැලුන බ්‍රාහ්මණයෙක් වන්නේ,
(1) අස්සලායන (2) කසීභාරද්වාජ (3) අග්ගිකභාරද්වාජ (4) සුන්දරීක භාරද්වාජ (5) වාසෙට්ඨ

15. නව අරහාදී බුදුගුණයන්ට අයත් විජ්ජාචරණ ගුණයට බුදුරදුන් සතුව පැවැති විශේෂ ඤාණ ශක්තීන් අටක් වූ අෂ්ට විද්‍යාවන් ද ඇතුළත් වේ. එම අෂ්ට විද්‍යාවන්ට ඇතුළත් නොවන්නේ,

(1) මනෝමයඉද්ධි ඤාණය. (2) ඉද්ධිවිධ ඤාණය.
(3) පුබ්බේනිවාසානුස්සති ඤාණය. (4) ආසවක්ඛය ඤාණය.
(5) ඉන්ද්‍රියපරෝපරියත්ත යථාභූත ඤාණය.

16. බුදුරජාණන් වහන්සේ හුදෙක් අනුශාසකයෙකු පමණක් නොවී ආදර්ශ සම්පන්න ද වූහ. පිවිතුරු චරිතයකින් යුක්ත වීම, විනිවිද භාවයෙන් කටයුතු කිරීම, විමසීමට හා විචාරයට ඉඩ සැළසීම, ශ්‍රාවකයන් පිළිබඳ නිරන්තර අවධානය හා ඔවුන්ගේ සුවිශේෂ කුසලතා හඳුනා ගැනීම, සුදුස්සාට සුදුසු වගකීම් පවරා දීම ආදිය උන්වහන්සේ තුළ පැවැති විශිෂ්ට ගුණාංගයෝ වෙති. සමස්තයක් ලෙස ඉහත ජේදයෙන් පෙනෙන්නේ,

(1) බුදුරදුන් ශ්‍රාවකයන් විෂයෙහි ප්‍රකට කළ මහාකරුණා ගුණයයි.
(2) බුදුරදුන් තුළ පැවැති ආගමික සහනශීලිත්වයයි.
(3) බුදුරදුන් තුළ පැවැති යථාවාදී තථාකාරී ගුණයයි .
(4) බුදුරදුන් තුළ පැවැති විශිෂ්ට නායකත්වයයි .
(5) බුදුරදුන් තුළ පැවැති ධර්ම ප්‍රචාරය කිරීමේ විශේෂ හැකියාවයි.

17. **"ඵුට්ඨස්ස ලෝක ධම්මේහි චිත්තං යස්ස න කම්පති"** යන ගාථා පාඨයෙන් ප්‍රකට වන බුද්ධ චරිතයේ විශිෂ්ට ගුණය හැඳින්වෙන්නේ,

(1). අරහං ගුණය ලෙස ය. (2). ලෝකවිදූ ගුණය ලෙස ය.
(3). තාදීගුණය ලෙස ය. (4). යථාවාදී තථාකාරී ගුණය ලෙස ය.
(5). පුරිස දම්ම සාරථී ගුණය ලෙස ය.

18. බුදුරජාණන් වහන්සේ වරක් චම්පා නුවරට වැඩම කළ පසු එගම නායක බමුණෙක් උන්වහන්සේ දැකීමට යාමට සූදානම් විය. ඔහුගේ සහචරයෝ ඒ ගමන වැළැක්වීමට විවිධ කතා කීහ. එහිදී බුදුරදුන්ගේ ගුණ කදම්බය වර්ණනා කළ නායක බමුණා සෙසු බමුණු පිරිස ද කැටිව බුදුරදුන් වෙත පැමිණියහ. එම බමුණා වූයේ,

(1) අග්ගිකභාරද්වාජ ය. (2) කසීභාරද්වාජ ය. (3) සුන්දරීකභාරද්වාජ ය.
(4) අක්කෝසකභාරද්වාජ ය. (5) සෝණදණ්ඩ ය.

19. ''**ස්වාමීනි, වඩිනු මැනවි. ඔබවහන්සේගේ පැමිණීම ඉතා අගනේ ය. වැඩහිඳිනු මැනවි. අසුන් පනවා තිබේයැ''** යි වච්ඡගොත්ත පරිබ්‍රාජකයා විසින් බුදුරදුන් පිළිගෙන තමා ද මිටි අසුනක හිඳගත් බව වච්ඡගොත්ත සූත්‍රයෙහි දැක්වෙන සංසිද්ධියෙන් ප්‍රකට වන්නේ,

(1) බුදුරජාණන් වහන්සේ තුළ පැවැති ආගමික සහනශීලි බවයි.
(2) බුදුරජාණන් වහන්සේ තුළ පැවැති සරල බවයි.
(3) බුදුරජාණන් වහන්සේ තුළ පැවැති ප්‍රියශීලි බවයි.
(4) බුදුරජාණන් වහන්සේ තුළ පැවැති සමාජශීලි බවයි.
(5) වච්ඡගොත්ත පරිබ්‍රාජකයා බුදුරදුන්ගේ සමීපතම දායකයකු වූ බවයි.

20. බුද්ධ කාලීන බොහෝ රාජ්‍ය පාලකයින් බුදුරදුන් සමග සමීප ඇසුරක් පවත්වාගෙන යමින් ශාසන උන්නතිය සඳහා මහගු මෙහෙවරක් ඉටුකර ඇත. ඇතැම් රාජ්‍ය පාලකයෝ මිත්‍රත්වය ඉක්මවා ගිය ඥාතිත්වයක් පවා ගොඩනගා ගැනීමට කැමැත්තක් දැක්වූහ. එසේ ඥාතිත්වයක් ගොඩනගා ගැනීමට යොමු වූ පාලකයෙකු ලෙස සැලකිය හැක්කේ,

(1). මගධාධිපති බිම්බිසාර රජතුමා ය.
(2). කෝසලයේ පසේනදි කොසොල් රජතුමා ය.
(3). අවන්තියේ පාලකයා වූ චණ්ඩපජ්ජෝත රජතුමා ය.
(4). වත්සයේ පාලකයා වූ උදේනි රජතුමා ය.
(5). ගන්ධාරයේ පාලකයා වූ පුක්කුසාති රජතුමා ය.

21 ධර්ම සේනාධිපති සැරියුත් මහරහතන් වහන්සේ විසින් දේශනා කළ සූත්‍ර ගණනාවක් සූත්‍ර පිටකය තුළ අන්තර්ගතව ඇත. එම සූත්‍ර අතර **එක නම් කුමක් ද?** ආදී වශයෙන් පිළිවෙළින් දහය දක්වා සංඛ්‍යාත්මක දහම් කරුණු ඇතුළත් කොට දේශනා කළ විශේෂ සූත්‍රය හැඳින්වෙන්නේ --------------- නමිනි.

(1) සංගීති සූත්‍රය (2) ගුලිස්සානි සූත්‍රය (3 සම්මා දිට්ඨි සූත්‍රය
(4) සම්පසාදනීය සූත්‍රය (5) ගෝසිංහ සූත්‍රය

22. බුදුරජාණන් වහන්සේ දේශනා කළ මහා නිදාන සූත්‍රය ශ්‍රවණය කිරීමෙන් අනතුරුව සෝවාන් ඵලයට පත් වූයේ,

(1) චිත්තගෘහපති උපාසකතුමාය (2) නකුලමාතා උපාසිකාවය (3) ඛේමා තෙරණින් වහන්සේය
(4) මහාප්‍රජාපති තෙරණින් වහන්සේය. (5) විශාඛා මහෝපාසිකාවය

23. ''**අත්තාහි අත්තනෝ නාථෝ කෝහි නාථෝ පරෝසියා''** යන බුදු වදන වඩාත් අර්ථවත් වන්නේ,

(1) බුදු දහමෙහි දැක්වෙන චින්තන හා වීමංශන නිදහස සම්බන්ධයෙනි.
(2) බුදු දහමෙහි දැක්වෙන පුද්ගල ස්වාධීනත්වය හා ස්වච්ඡන්දතාව සම්බන්ධයෙනි.
(3) බුදු දහමෙහි දැක්වෙන ආගමික සහනශීලිත්වය සම්බන්ධයෙනි.
(4) බුදු දහමෙහි දැක්වෙන හොඳ - නරක විනිශ්චය සම්බන්ධයෙනි.
(5) බුදු දහමෙහි දැක්වෙන ආකාරවතී ශ්‍රද්ධාව සම්බන්ධයෙනි.

24. බුදු දහමට පරිබාහිරව භාරතීය සමාජය තුළ පැවැති සෙසු ආගමික ඉගැන්වීම් අතර ඊශ්වර නිර්මාණවාදය, පුබ්බේකතහේතුවාදය, නියතිවාදය, අහේතු අප්පච්චයතාවාදය ප්‍රධාන වේ. නමුත් බුදු දහමින් මෙම ඉගැන්වීම් ප්‍රතික්ෂේප කෙරුණි. එසේ ප්‍රතික්ෂේප වීමට බලපෑ විවිධ හේතූන් අතර ප්‍රමුඛ හේතුවක් වන්නේ,

(1) පුද්ගල ස්වාමිත්වයට හා ස්වාධීනත්වයට ඒ තුළින් අවස්ථාවක් නොලැබීම.
(2) කර්ම විපාක නොපිළිගැනීම.
(3) ආගමික නිෂ්ටාවක් දක්නට නොලැබීම.
(4) අනගාරික ප්‍රතිපදාවට ඒ තුළින් අවස්ථාවක් නොලැබීම.
(5) පරාර්ථචර්යාවන්ට අවස්ථාවක් නොලැබීම.

25. සමාජයේ ප්‍රභවය වූ කලී ඊශ්වර නිර්මාණයක් නොව විවිධ සාධක මත පදනම් ව ක්‍රමික ව, හේතුඵලවාදී ව විකාශය වීමේ ප්‍රතිඵලයක් ලෙස බුදුසමය පිළිගනී. ඒ අනුව ප්‍රාථමික සමාජ ඒකකයක් වූ ගෘහස්ථ ජීවිතයේ ප්‍රභවය දීඝනිකායේ අග්ගඤ්ඤ සූත්‍රයේ දී දක්වා ඇත්තේ,
(1) මෛථුන්දම් සේවනය කිරීමේ ප්‍රතිඵලයක් වශයෙනි.
(2) සමාජය තුළ සොරකම් බහුලවීමේ ප්‍රතිඵලයක් වශයෙනි.
(3) එක්රැස් කොට අනුභව කිරීමේ ප්‍රතිඵලයක් වශයෙනි.
(4) දෘෂ්ටානුගතියට පැමිණීමේ ප්‍රතිඵලයක් වශයෙනි.
(5) පොදු දේපොල පරිහරණය කිරීමේ ප්‍රතිඵලයක් වශයෙනි.

26. සක්විති රාජ්‍ය යනු පියාගෙන් පුතුට උරුම වන දායාදයක් නොවන බව චක්කවත්තිසීහනාද සූත්‍රය අවධාරණය කරයි. බෞද්ධ ඉගැන්වීම් අනුව චක්‍රවර්ති රාජ්‍යනම් පරමාදර්ශී පාලන තන්ත්‍රයයි. එය බිහිකර ගත හැක්කේ,
(1) රටේ ආර්ථික සංවර්ධනය උපරිමත්වයට පත් කරගැනීමෙනි.
(2) අධාර්මික ක්‍රියාකරන අපරාධකරුවන් මුලිනුපුටා දැමීමෙනි.
(3) ආචාර ධර්මමය වශයෙන් පාලකයා සුදුසුකම් සපුරා ගැනීමෙනි.
(4) පුරෝහිත බමුණන්ගෙන් අවවාද අනුශාසනා ලබා ගැනීමෙනි.
(5) රාජ්‍ය සේවයේ නියුතු වූවන්ට නිසි පරිදි බත් වැටුප් ලබා දීමෙනි.

27. සියලු රටවැසියන්ට පමණක් නොව පක්ෂීන්ට සිව්පාවුන්ට පවා දැහැමි රැකවරණය සැළසීම, සිය රටෙහි අධාර්මික ක්‍රියාවලට ඉඩ නොතැබීම දිළිඳුභාවය දුරු කොට ආර්ථික සංවර්ධනය පිණිස කටයුතු කිරීම යන කරුණු ඇතුළත් වන බෞද්ධ දේශපාලන මූලධර්මය හඳුන්වන්නේ,
(1) සතර සංග්‍රහ වස්තු නමිනි. (2) දස සක්විතිවත් නමිනි. (3) දසරාජ ධර්ම නමිනි.
(4) සප්ත අපරිහානීය ධර්ම නමිනි. (5) දස පින්කිරිය වත් නමිනි.

28. පුඤ්ඤ - පාප, කුසල - අකුසල සාධු - අසාධු ආදී පුද්ගලයාගේ සචේතනික ක්‍රියා විනිශ්චයෙහිලා අම්බලට්ඨික රාහුලෝවාද සූත්‍රයෙන් ප්‍රකටවන නිර්ණායකය කුමක් ද ?
(1) ලෝභ - දෝස - මෝහ චේතනා මුල්කරගත් ක්‍රියා අකුසල කර්ම වන අතර අලෝභ - අදෝස - අමෝහ සහගත ක්‍රියා කුසල කර්ම වේ.
(2) යම් ක්‍රියාවක විපාකය පසු තැවීමට හේතුවේ නම් අකුසල වන අතර යම් ක්‍රියාවක විපාකය පසු තැවීම හේතු නොවේ නම් කුසල ක්‍රියාවේ.
(3) තමා උපමාකොට අනුන් නොනැසිය යුතුය.
(4) තමා ලෝකය හා ධර්මය අධිපතිකොට සිතා හොඳ - නරක තීරණය කළ යුතුය. .
(5) තමාට මෙරමාට හා උභය පක්ෂයට අයහපත් වන ක්‍රියා නරක ක්‍රියා ලෙසත් යහපත්වන ක්‍රියා හොඳ ක්‍රියා ලෙසත් තීරණය කළ යුතුය.

29. **''මේ දහම් අකුසල් ය. මේ දහම් වරද සහිත ය. මේ දහම් නුවණැත්තන් විසින් ගරහන ලද්දේ ය. මේ දහම් පිළිපැදීමෙන් සමාදන් වීමෙන් අවැඩ පිණිස දුක් පිණිස පවත්නාහ'යි යම් කලෙක තෙපි තුමූ ම දැනගන්නාහු නම් එය දුරුකරව්''** යනුවෙන් දැක්වෙන බුද්ධානුශාසනාවෙන් අවධාරණය කෙරෙන්නේ,
(1) බුදු දහම කාලාම සූත්‍රාගත කුසල් පමණක් කිරීම අගය කළ බවයි.
(2) බුදු දහම නුවණැත්තන් විසින් ගරහන ලද දේ අගය කළ බවයි.
(3) බුදු දහම අත්තනෝමතික පුද්ගල චින්තනය උසස් යැයි අගය කළ බවයි.
(4) බුදු දහම කිසිවකුට අවැඩ පිනිස දුක් පිනිස හේතු නොවන දේ කිරීම අගය කළ බවයි.
(5) බුදු දහම නිදහස් චින්තනය අගය කළ බවයි.

30. වර්තමානයේ බොහෝ බෞද්ධයෝ අවිවේකී ගෘහස්ථ ජීවිතය තුළ ප්‍රඥා සංවර්ධනයට ඉවහල් වන භාවනානුයෝගී කටයුතුවලට වඩා දානාදී ආමිස පූජාවන්හි යෙදෙති. භක්තිමත්භාවය වැඩි වන තරමට භෞතික පුදපූජාවලද වැඩි වැඩියෙන් යෙදෙති. එහෙත් යථාර්ථාවබෝධය පිණිස තීරණාත්මක සාධකය ප්‍රඥාවයි. බෞද්ධ මූල ධර්මවලට අනුව බෞද්ධයකු,
(1) ශ්‍රද්ධාව වැඩිපුර වැඩිය යුතු ය.
(2) ප්‍රඥාව වැඩිපුර වැඩිය යුතු ය.
(3) ශ්‍රද්ධාව වැඩියෙනුත් ප්‍රඥාව අඩුවෙනුත් වැඩිය යුතු ය.
(4) ශ්‍රද්ධාවෙන් ආරම්භව ප්‍රඥාවෙන් කෙළවර යුතු ය.
(5) ප්‍රඥාව වැඩියෙනුත් ශ්‍රද්ධාව අඩුවෙනුත් වැඩිය යුතු ය.

31. දස පිංකරියවත්හි එන ගරු බුහුමන් කිරීම **.........................** . . යනුවෙන් හැඳින්වේ.
(1) වෙය්‍යාවච්ච (2) උපට්ඨාන (3 පත්තිදාන (4) අපචායන (5) පත්තානුමෝදනා

32. සෞන්දර්ය රසාස්වාදයේදී බෞද්ධයා විසින් අවධානයට ලක් කළ යුතු මූලික කාරණය වන්නේ,
(1) සෞන්දර්ය රසාස්වාදය වැරදි ක්‍රියාවක් බවයි.
(2). සෞන්දර්ය රසාස්වාදයෙන් ඉන්ද්‍රිය සංවරය පිරිහෙන බවයි.
(3). සෞන්දර්ය රසාස්වාදය ගිහි පැවිදි සෑම දෙනාට ම තහනම් කර ඇති බවයි.
(4). උපාදාන ආකල්පයෙන් තොරව දැහැමිව සෞන්දර්ය රසවිඳීම වරදක් නොවන බවයි.
(5) සෞන්දර්ය රසාස්වාදයෙන් තොර මිනිසා තිරිසනකු වැනි යැයි උගන්වා ඇති බැවින් ජීවිත කාලයම සෞන්දර්ය රසවිඳිය යුතු බවයි.

33. පරිසර සංරක්ෂණයෙහිලා බුදු සමයේ අවදානය කෙතෙක් ද යන්න සූත්‍ර පිටකයේ මෙන් ම විනය පිටකයේ ද එන විවිධ තොරතුරුවලින් පැහැදිලිය. රුක් රෝපණය උද්‍යාන නිර්මාණය, ඒ දඬු පාලම් සෑදීම පැන්හල් පැන් පොකුණු නිර්මාණය, දිවා රෑ පින් වැඩෙන පින්කම් ලෙස දක්වා තිබීම, මෙයට කදිම නිදසුනක් වන අතර එම දේශනාව ඇතුළත් වන්නේ,
(1) සිංසපා සූත්‍රයේය. (2) මහාපරිනිබ්බාණ සූත්‍රයේය. (3) වනරෝපා සූත්‍රයේය.
(4) මෙත්ත සූත්‍රයේය. (5) අරියපරියේසන සූත්‍රයේය.

34. ගෘහස්ථ ජීවිතයක සාර්ථකත්වය සඳහා ආර්ථික සමෘද්ධිය අවශ්‍යම සාධකයක් බව බුදු දහම පිළිගනී. උට්ඨාන සම්පදාවෙන් නිර්දේශ කරන්නේ අලස නොවී උත්සහවත්ව අප්‍රමාදීව කටයුතු කොට ශක්තිමත් ආර්ථිකයක් ඇති කරගත යුතු අකාරයයි. ආර්ථික සමෘද්ධිය සඳහා ධනාත්මක අවධානයක් යොමු කරන බුදුසමය ධනය ඉපැයීමට අදාළව අත්‍යවශ්‍ය වන ගුණාත්මක සීමා ද දක්වා තිබේ. එවැනි සීමා දෙකක් ලෙස සැලකිය හැක්කේ,
(1) අප්‍රමාදී බව හා උත්සහයයි.
(2) ධාර්මිකත්වය හා අසාහසිකත්වයි.
(3) අනලස් බව හා සත්‍යවාදී වීමයි.
(4) වෙළඳාමෙහි හා කෘෂිකර්මාන්තයේ යෙදීමයි.
(5) කායික ශ්‍රමය හා මානසික ශක්තිය යෙදවීමයි.

35. **"ඉඳින් කුළ පුත්‍රය ස්වල්ප ආදායමක් ඇති ව බොහෝ වියදම් කෙරේ ද දිඹුල් ඵල කා දමන්නෙකු මෙන් හෙතම වස්තුව කා වැනසෙන්නෙකි'යි** කියා ද **බොහෝ ආදායම් ඇතිව දුකසේ දිවි ගෙවයි ද හෙතෙම නොකා නොබී මැරෙන්නෙකි** 'යි කියා ද පවසන්නෝ වෙති. මෙම ප්‍රකාශයන්ගෙන් ගම්‍ය වන්නේ,

(1) භෝග සුඛය පිළිබඳ අදහසකි. (2) භෝග විනාස මුඛ පිළිබඳ අදහසකි.
(3) ධනෝපායනය පිළිබඳ අදහසකි. (4) සම්පත් කළමනාකරණය පිළිබඳ අදහසකි.
(5) සම්පත් ආරක්ෂා කිරීම පිළිබඳ අදහසකි.

36. නීතිගරුක වීම රටක සැම පුරවැසියකුගේ ම යුතුකම හා වගකීම වන්නේ ය. සමාජයේ සාමය, සහජීවනය හා යහපැවැත්ම රඳාපවතින්නේ නීතිගරුක වීම නිසා ය. නීතිගරුකවීම බුදු දහම ඉතා අගය කොට සලකන අතර එසේ ඇගයීමට ලක්කළ අවස්ථාවක්,

(1) මහාපදේස තුළින් ප්‍රකට වේ. (2). අපරිහානීය ධර්ම තුළින් ප්‍රකට වේ.
(3). අෂ්ටගරු ධර්ම තුළින් ප්‍රකට වේ. (4). අධිකරණ සමථ තුළින් ප්‍රකට වේ.
(5). දසරාජ ධර්ම තුළින් ප්‍රකට වේ.

37. පොදු භාණ්ඩ විනාශයට යා නොදී සුරක්ෂිත ව තබාගැනීම තෘෂ්ණාවෙන් තොර ව ප්‍රවේශමෙන් පරිහරණය කිරීමට විනය පිටකයේ මහාවග්ග පාළියේදී භික්ෂු සමාජය තුළ නිළධාරි මණ්ඩලයක් ද පත් කර ඇත. එහි යාගුභාජක ලෙස නම්කර ඇත්තේ,

(1) කැඳ බෙදන්නා ය. (2). ආදිකම්මිකයා ය. (3). ආහාර බෙදන්නා ය.
(4). සෙනසුන් පනවන්නා ය. (5) චීවර බෙදන්නා ය.

38. සාර්ථක ගිහි ජීවිතයක පැවැත්ම සඳහා අත්ථි සුඛ, භෝග සුඛ, අණන සුඛ හා අනවජ්ජ සුඛ යන සිව් වැදෑරුම් ලෞකික සුඛ අවශ්‍ය බව බුදු දහම පෙන්වා දෙයි. මේ අතරින් භෝග සුඛය නමින් හැඳින්වෙන්නේ

(1) ධාර්මිකව උපයාගත් සම්පත් තමන් සතුව ඇතැයි ලබන සතුටයි.
(2) ධාර්මිකව උපයාගත් සම්පත් තම දූ පුතුන්ට බෙදා දී ලබන සතුටයි.
(3) ධාර්මිකව උපයාගත් සම්පත් තමන් දානාදී යහපත් කටයුතු සඳහා වැය කිරීමෙන් ලබන සතුටයි.
(4) ණය නොවී උපයාගත් සම්පත් තමන් සතුව ඇතැයි ලබන සතුටයි.
(5) ධාර්මිකව උපයාගත් සම්පත් අර්ථවත්ව වැය කරමින් මැනවින් පරිභෝග කරමින් ලබන සතුටයි.

39. සිරිපාල අලස පුද්ගලයෙක්ය. මත්පැන් පානයට ඇබ්බැහි වූයේ පව්වු මිතුරන් නිසාය. සවස් කාලයේ නිකරුනේ සැරිසරන ඔහු නිවසට එන්නේ බොහෝ රෑ බෝ වීය. මුදලට ඕට්ටු ඇල්ලීම නිසා ඔහු සීඝ්‍ර ලෙස ආර්ථික අතින් ද පරිහානියට පත් විය. සිරිපාල මෙම තත්ත්වයට උදාවීමට භෝග විනාශ මුඛයන්ගෙන්,

(1). පහක් බලපා ඇත. (2). හයක් බලපා ඇත. (3). හතරක් බලපා ඇත.
(4). දෙකක් බලපා ඇත. (5). එකක් බලපා ඇත.

40. බුදු දහම සසර දුක් සහිත බව අවධාරණය කරයි. ඉන් අදහස් වන්නේ,

(1). සදාචාරාත්මක සීමාවන් තුළ ලෞකික වූ පස්කම් සුවය විඳිය යුතු බවය.
(2). බෞද්ධයා ලෞකික වූ පස්කම් සුව විඳිය යුතු නැති බවය.
(3). එහි කිසිදු සැපයක් නැති බවය.
(4). පස්කම් සැප සසරට බාධාවක් බවය.
(5). කම්සැප විඳීම බුදුදහම සම්පූර්ණයෙන් ප්‍රතික්ෂේප කොට ඇති බවය.

41. සිගාලෝවාද සූත්‍රාගත සමාජ යුතුකම්වලට අනුව වැරදිවලින් වළක්වමින් අනුකම්පාශීලීව කටයුතු කරන දෙපිරිස වන්නේ,

(1) ශ්‍රමණ බමුණෝ හා ගුරුවරු ය. (2) ගරුවරු හා දෙමව්පියෝ ය. (3) දාසයෝ හා දරුවෝ ය.
(4) ශ්‍රමණ බමුණෝ හා දෙමාපියෝ ය. (5) මිතුරෝ හා අඹුදරුවෝ ය.

42. "නිධීනං'ව පවත්තාරං ..." යනාදී වශයෙන් දක්වෙනගාථා වට අනුව නිධානයක් ඇති තැන පෙන්වා දෙන්නෙකු මෙන් සැලකිය යුත්තේ කවර පණ්ඩිතයෙකු ද?

(1) අසත් පුරුෂයන් අප්‍රිය කරන තැනැත්තා ය. (2) තමාගේ යහපත සඳහා පමණක් කටයුතු කරන්නා ය.
(3) වරද දැක ඉවසා සිටින්නා ය. (4) මෙරමාගේ යහපත සඳහා පමණක් කටයුතු කරන්නාය.
(5) වරද දැක තරවටු කොට හෝ අවවාද කරන්නා ය.

43. පෙර කළ පිං ඇති බව නිසා ම ශාන්තට ස්ථිර පදිංචියට ඉතා සුදුසු ම ප්‍රදේශයක නිවස තනාගැනීමට හැකි විය. ඔහු තම මහළු මව හා පියා මනාව පෝෂණය කරමින් අඹුදරුවන්ට ද සංග්‍රහ කරමින් ධාර්මික රැකියාවක් කළේ ය. ශ්‍රමණයන් වහන්සේලා දැකීමට බොහෝ ප්‍රිය කළ ශාන්ත උන්වහන්සේලා සමග ධර්ම සාකච්ඡා ද සිදු කරයි. ශාන්තගේ දිවි පැවැත්ම තුළ මංගල සූත්‍රයට අනුව මංගල කරුණු කොපමණ තිබේ ද?

(1) 08කි. (2) 07කි. (3) 10කි. (4) 11කි. (5) 09කි.

44. තමා වෙත පැමිණෙන ශ්‍රමණබ්‍රාහ්මණ හා යාචකාදීහු බොරුවෙන් රවටන පුද්ගලයා තුළින් ප්‍රකට වන්නේ,
(1) ඔහුගේ අවස්ථෝචිත ව හැඩගැසීමේ ස්වභාවයයි (2) ඔහුගේ පරිහානියේ ස්වභාවයයි
(3) ඔහුගේ කෛරාටික බවේ ස්වභාවයයි (4) ඔහුගේ ආගමික විරුද්ධතාවේ ස්වභාවයයි
(5) ඔහුගේ කිසිවෙකුට නොරැවටෙන ස්වභාවයයි

45. සබ්බකාමී මහරහතන් වහන්සේට වජ්ජි පුත්තක භික්ෂූන්ගේ නොනිසි හැසිරීම් රටාව ගැන දැනගන්නට ලැබුණු පසු ඒ ගැන සෙවීමට යස හිමියන් විශාලා මහනුවරට යවන ලදී. එහිදී යස හිමියන්ට දස වස්තුව අතුරින් මුලින් ම දැන ගැනීමට ලැබුණේ,

(1) ද්වංගුල කප්පයයි. (2) අදසක නිසීදන කප්පයයි. (3) ගාමන්තර කප්පයයි.
(4) ජාත රූප රජත කප්පයයි. (5) සිංගිලෝණ කප්පයයි.

46. තෙවන ධර්ම සංගායනාවේ විශිෂ්ටම ප්‍රතිඵලය වන්නේ භාරතයෙන් බාහිර ප්‍රදේශ නවයකට දහම් ප්‍රචාරය කරවීමයි. ඒ සඳහා සැලසුම් සහගතව ධර්මදූත කණ්ඩායම් 09 ක් යොමුකරන ලදී. ඒ අනුව ''අපරන්තය දේශය''ට ධර්ම දූත කාර්යය සඳහා වැඩමකළේ,

(1) මහා ධම්මරක්ඛිත හිමි. (2) මජ්ඣිම තෙර. (3) යෝණක ධම්මරක්ඛිත තෙර.
(4) රක්ඛිත තෙර. (5) මජ්ඣන්තික තෙර.

47. මොග්ගලිපුත්ත තිස්ස හිමියන් විසින් පරවාද මත පන්සීයක් ඛණ්ඩනය කරමින් ස්වකීය ථෙරවාදී මතවාදයන් පන්සීයක් උද්දීපනය කරමින් ---------------------- රචනා කළ නිසා අභිධර්ම පිටකය ද සම්පූර්ණ විය.

(1) යමකප්පකරණය (2) මිලින්ද පඤ්හය (3) පේටකෝපදේසය
(4) පේතවත්ථුව (5) කථාවත්ථුප්පකරණය

48. මිනිස් ඝාතන නිසා දැඩි කම්පාවට හා කලකිරීමට පත් අශෝක දික්විජය අතහැර ධර්ම විජය ප්‍රතිපත්තිය අනුගමනය කරන්නට පෙලඹුණ අයුරු දක්වා ඇති ගිරි ලිපිය වන්නේ,

(1) කාල්සි ගිරි ලිපියයි. (2) 13 වන ගිරි ලිපියයි. (3) බරාබර් ගුහා ලිපියයි.
(4) 07 වන ගිරි ලිපියයි. (5) ගිරිනාර් 13 වන ගිරි ලිපියයි.

49. **'' ... මෙවර රාජ්‍යයට පත් වන රජෙක් මගේ ශරීර ධාතුවලින් විශාල කොටසක් පිහිටුවා මේ තැන ස්තූපයක් ගොඩනංවන්නේයැ'යි. ... කණිෂ්කාධිරාජයෝ පුරාකෘත පුණ්‍ය ඇත්තෝ ය. ඒ උත්තම ශාස්තෘවරයාගේ අනාවැකිය සිද්ධ කිරීමට මෙය යෝග්‍ය කාලය වන බව සිහිපත් කරමි'යි උත්තර දී ගොපලු දරුවා නොපෙනී ගියේ ය. මේ කීම ඇසූ රජ මහත් ප්‍රීතියට පත් ව බෞද්ධාගමට ගෞරව කරමින් බුද්ධාගම ''වැළඳ ගත්තේ ය.''** යන උපතින් හින්දු භක්තිකයකු වූ කණිෂ්ක රජු බුදුසමය වැළඳගත් මෙම පුවත වාර්තාවන මූලාශ්‍රය වන්නේ,

(1) ඉට්සිං භ්‍රමණ වෘත්තාන්තයයි (2) හියුං සියැං භ්‍රමණ වෘත්තාන්තයයි
(3) ඉබන් බතුතා භ්‍රමණ වෘත්තාන්තයයි (4) ෆාහියන් භ්‍රමණ වෘත්තාන්තයයි
(5) අශෝකාවදාන පුරා වෘත්තාන්තයයි

50. නාලන්දා විශ්වවිද්‍යාලයයේ තන්ත්‍රයාන බුදුසමය පිළිබඳ මහාචාර්ය ධුරය හෙබවූ කම්පාල තෙරණුවන් පළ කළ අදහසට ගරු කළ ක්‍රි.ව. 770 - 810 අතර රජ කළ ----------------- විසින් වික්‍රමශිලා විශ්වවිද්‍යාලයේ ප්‍රථම සංඝාරාමය ඉදි කරවන ලදී.

(1) ගුහසේන රජතුමා (2) සක්‍රාදිත්‍ය රජතුමා (3) කීර්තිපාල රජතුමා
(4) ධර්මපාල රජතුමා (5) බුද්ධගුප්ත රජතුමා

සියලු හිමිකම් ඇවිරිණි / All Rights reserved

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
Provincial Department of Education - NWP

45 S II

පළමු වාර පරීක්ෂණය - 13 ශ්‍රේණිය - 2019
First Term Test - Grade 13 - 2019

විභාග අංකය .............................

බෞද්ධ ශිෂ්ටාචාරය II

කාලය පැය තුනයි
අමතර කියවීම් කාලය මිනි. 10 යි.

- අමතර කියවීම් කාලය ප්‍රශ්න පත්‍රය කියවා ප්‍රශ්න තෝරා ගැනීමටත් පිළිතුරු ලිවීමේ දී ප්‍රමුඛත්වය ලබාදෙන ප්‍රශ්න සංවිධානය කර ගැනීමටත් යොදා ගන්න.
- I කොටසින් ප්‍රශ්න දෙකක් ද, II කොටසින් ප්‍රශ්න තුනක් ද තෝරාගෙන ප්‍රශ්න පහකට පිළිතුරු සපයන්න.

## I කොටස

**(මෙම කොටසින් ප්‍රශ්න දෙකක් පමණක් තෝරාගෙන පිළිතුරු සපයන්න.)**

1. i. ගෘහස්ථ ආශ්‍රමය හඳුන්වා දෙන්න.
   ii. බුදු සමය ඉදිරිපත්කරන ආචාර විද්‍යාත්මක සාධක තුළින් බ්‍රාහ්මණ වර්ණ ධර්ම බැහැර කෙරෙන අයුරු පෙන්වා දෙන්න.
   iii. බ්‍රාහ්මණ ඉගැන්වීම් තුළින් කාන්තාවගේ සාමාජික වරප්‍රසාද අහිමි වූ ආකාරය නිදසුන් හතරක් මගින් පැහැදිළි කරන්න.
   iv. බුදු දහමට අනුව ප්‍රඥා ප්‍රතිලාභයට ස්ත්‍රීත්වය බාධාවක් නොවූ අයුරු නිදසුන් හතරක් මගින් පහදන්න.
   v. බුද්ධ කාලීන භාරතයේ පැවැති වෙළඳ ආර්ථිකය පිළිබඳ විවරණයක් සපයන්න.

2. i ශ්‍රමණ සංස්කෘතියට අදාළ අනන්‍යතා ලක්‍ෂණ හතරක් පෙන්වා දෙන්න.
   ii. සංජය බෙල්ලට්ඨිපුත්ත ශාස්තෘවරයාගේ දර්ශනය ගෙනහැර දක්වන්න.
   iii. සංජයය බෙල්ලට්ඨිපුත්ත ශාස්තෘවරයාගේ දර්ශනය පිළිබඳ බුදුසමයේ ආකල්පය සංක්‍ෂේපයෙන් ඉදිරිපත් කරන්න.
   iv. සිගාලෝවාද සූත්‍රයේ දැක්වෙන ගුරු - ශිෂ්‍ය යුතුකම් හා වගකීම් නම් කරන්න.
   v. සුරාපානයෙන් වැළකීමේ සමාජමය වටිනාකම පෙන්වා දෙන්න.

3. i. බුදුරජාණන් වහන්සේගේ මහා ප්‍රඥාව පිළිබඳ විවරණයක යෙදෙන්න.
   ii. **සත්ථා දේවමනුස්සානං** බුදුගුණය විස්තර කරන්න.
   iii. ආනන්ද තෙරුන් වහන්සේ නිත්‍ය උපස්ථායක ධුරය භාරගැනීමට පෙර බුදුරදුන්ගෙන් අයැද සිටි ආයාචනා හතර හා ප්‍රතික්ෂේප හතර වෙන වෙන ම ඉදිරිපත් කරන්න.
   iv. **ජයං වේරං පසවති** යන ගාථාව සම්පූර්ණ කරන්න.
   v. එහි තේරුම නිවැරදිව ලියන්න.

## ii කොටස
**(මෙම කොටසින් ප්‍රශ්න තුනක් පමණක් තෝරාගෙන පිළිතුරු සපයන්න.)**

4. i. පුද්ගලයා හා සමාජය අතර සබැඳියාව තහවුරු කිරීමට සිඞ්ගාල විහරණයන්හි පවත්නා කාලීන වැදගත්කම ඇගයීමට ලක්කරන්න.
   ii. පරිසර සංරක්ෂණය පිළිබඳ බෞද්ධ ඉගැන්වීම්වල කාලීන වැදගත්කම පෙන්වා දෙන්න.

5. i. ජනතාවාදී රාජ්‍ය පාලනයක් බිහිකරගැනීමෙහිලා බෞද්ධ දේශපාලන ඉගැන්වීම්වල පවත්නා සර්වකාලීන වැදගත්කම ගෙනහැර දක්වන්න.
   ii. සෞන්දර්ය රසාස්වාදයට බුදු දහමින් බාධාවක් නොවන බව සනිදර්ශනව පෙන්වා දෙන්න.

6. i. ධන පරිබෝජනය පිළිබඳ බෞද්ධ ඉගැන්වීම් සමාජ සහජීවනයට ඉවහල්වන ආකාරය පෙන්වා දෙන්න.
   ii. තෘප්තිමත් ගෘහ ජීවිතයක් සඳහා හේතුවන චතුර්විධ සුඛය පිළිබඳ බෞද්ධ ඉගැන්වීම් උපයෝගීවන ආකාරය විස්තර කරන්න.

7. i. පැරණි භාරතීය විශ්වවිද්‍යාල අතුරෙන් වලභි විශ්වවිද්‍යාලයට හිමිවන සුවිශේෂත්වය ප්‍රකට කරන්න.
   ii. අශෝක රජතුමා විසින් සිදුකරන ලද ශාසනික මෙහෙය ඓතිහාසික සාධක ඇසුරෙන් විමසීමක් කරන්න.

8. i. බුද්ධකාලීන ධර්ම ප්‍රචාරක සේවාවේ සාර්කත්වය උදෙසා ශ්‍රාවක සංඝයාගෙන් ඉටු වූ මෙහෙය අගයන්න.
   ii ද්විතීය ධර්ම සංගායනාව ශාසන ඉතිහාසයේ සන්ධිස්ථායක් සනිටුහන් කරන්නේ කවර හෙයින්දැ'යි පරීක්ෂා කරන්න.

# පළමුවන වාර පරීක්ෂණය - 13 ශ්‍රේණිය - 2019
## බෞද්ධ ශිෂ්ටාචාරය I - පිළිතුරුපත්‍රය

| ප්‍රශ්න අංකය | පිළිතුර | ප්‍රශ්න අංකය | පිළිතුර |
|---|---|---|---|
| 01 | 2 | 26 | 3 |
| 02 | 5 | 27 | 2 |
| 03 | 3 | 28 | 5 |
| 04 | 1 | 29 | 5 |
| 05 | 4 | 30 | 4 |
| 06 | 5 | 31 | 4 |
| 07 | 1 | 32 | 4 |
| 08 | 4 | 33 | 3 |
| 09 | 2 | 34 | 2 |
| 10 | 3 | 35 | 4 |
| 11 | 4 | 36 | 2 |
| 12 | 4 | 37 | 1 |
| 13 | 3 | 38 | 5 |
| 14 | 2 | 39 | 1 |
| 15 | 5 | 40 | 1 |
| 16 | 4 | 41 | 4 |
| 17 | 3 | 42 | 5 |
| 18 | 5 | 43 | 3 |
| 19 | 1 | 44 | 2 |
| 20 | 2 | 45 | 4 |
| 21 | 1 | 46 | 3 |
| 22 | 3 | 47 | 5 |
| 23 | 2 | 48 | 1 |
| 24 | 1 | 49 | 2 |
| 25 | 1 | 50 | 4 |

## II පත්‍රය

1. i. ගෘහස්ථ ආශ්‍රමය හඳුන්වා දෙන්න.

- ඉගෙණීමෙන් පසු ගෘහස්ථයෙකු බවට පත්ව විවාහ ජීවිතයට ඇතුළත්ව අඹු දරුවන් පෝෂණය කිරීම .
- කාමභෝගී ජීවිතයක් ගතකිරීම
- පුතාට පුතෙක් ලැබෙනතුරු වයස අවුරුදු පනහ දක්වා කාලයක් කම්සැප විඳීමට අවස්ථාව සැළසීම
- පාරම්පරික ණයෙන් නිදහස්වීමට මුණුබුරකු සිටීම අවශ්‍යම කරුණක් බව
- චතුර්විධ පුරුෂාර්ථ අතුරින් කාම පුරුෂාර්ථයට ප්‍රමුකත්වයක් ලබාදීම (ලකුණු 4යි)

ii. බුදු සමය ඉදිරිපත්කරන ආචාර විද්‍යාත්මක සාධක තුළින් බ්‍රාහ්මණ වර්ණ ධර්ම බැහැර කෙරෙන අයුරු පෙන්වා දෙන්න.

- වර්ණ හතරෙහි කවරෙකුට වුව ද පැවිදි වී තම ධර්මයෙන් බැහැර වී පැවිද්දට පත්ව ආධ්‍යාත්මික පාරිශුද්ධිය ඇතිකර ගතහැකිවීම
- වසල සූත්‍රයේ දී උපතින් බ්‍රාහ්මණයෙක්වත් වසලයෙක් නොවන අතර ක්‍රියාවෙන් බ්‍රාහ්මණයෙක් හා වසලයෙක් වන බව දේශනා කර තිබීම.
- කණ්ණකත්ථල සූත්‍රයේදී ගින්න කවරෙකු විසින් කුමන දර විශේෂයක් භාවිත කොට දල්වුව ද එහි වෙනසක් නැත්තා සේ කවර අයෙකු විසින් හෝ වීර්යෙන් ලබන විමුක්තියෙහි වෙනසක් නොමැතිබව (ලකුණු 4යි)

iii. බ්‍රාහ්මණ ඉගැන්වීම් තුළින් කාන්තාවගේ සාමාජික වරප්‍රසාද අහිමි වූ ආකාරය නිදසුන් හතරක් මගින් පැහැදිලි කරන්න.

- කාන්තාව සදාකාලික පුරුෂයාගේ ආධිපත්‍යයට නතුකර තිබීම (බාල්‍යෙ පිතුර් වශේ තිෂ්ඨේත්)
- ස්වාමියා මියගියපසු සති පූජාව හෝ පර්දා චාරිත්‍රය ඉටුකිරීමට සිදුවීම
- සමාජය තුළ ඇය අවමානයට පාත්‍රවන ආකාරයට ඉගෙන්වීම් ඉදිරිපත්වීම ( ඖදුම්බරං භවං පුෂ්පං ---)
- වයස්ගත පුරුෂයින් ලාබාල ගැහැණු දරුවන් විවාහකර ගැනීම
- ස්ත්‍රිය හා ශුද්‍රයා අතර වෙනසක් නොවන ආකාරයට ක්‍රියා කිරීම ( ස්ත්‍රියක මැරීම ශුධ්‍රයක මැරීමට සමාන කිරීම) යාගය වැනි ආගමික කටයුතු වලට ඇය සම්බන්ධ කර නොගැනීම (ලකුණු 4යි)

iv. බුදු දහමට අනුව ප්‍රඥා ප්‍රතිලාභයට ස්ත්‍රීත්වය බාදාවක් නොවූ අයුරු නිදසුන් හතරක් මගින් පහදන්න.

- මාර්ගඵල ලාභී ගිහි පැවිදි කාන්තාවන් පිලිබඳව බෞද්ධ සාහිත්‍යයේ දක්වෙන තොරතුරු ඇසුරෙන් පිළිතුර සකස් විය යුතුය. විශේෂයෙන් මාර්ග ඵලලාභී විශාඛා, සාමාවතී, සුජාතා. ආදී ගිහි කාන්තාවන් මෙන් ම ප්‍රජාපතී ගෝතමී තෙරණිය ඇතුලු භික්ෂුණීන් වහන්සේලාගේ චරිත ස්මතුකරමින් පිලිතුර සකස්විය යුතුය. (ලකුණු 4යි)

v. බුද්ධ කාලීන භාරතයේ පැවැති වෙළඳ ආර්ථිකය පිලිබඳ විවරණයක් සපයන්න.

- භාණ්ඩ හුවමාරු වෙනුවට මුදල් භාවිතයට ක්‍රමයෙන් හුරු වීම මඟින් මස්ස, අඩමස්ස, කහවණු වැනි ලෝහ කාසි, භාවිතය සමාජය තුළ ව්‍යාප්ත වීම හා නව වෙළෙඳ පන්තිය බිහි වූ බව.
- භාරතයේ දේශීය මාර්ග පද්ධතිය දියුණු වී අන්තර්ජාතික සමුද්‍ර මාර්ග හා බද්ධ වීම, ගොඩබිම් මාර්ග හා සමුද්‍ර මාර්ග ඔස්සේ වෙළෙඳාම් කටයුතු සිදුකිරීම, සුප්පාරක, භාරුකච්ච හා තාම්‍රලිප්ති වැනි වෙළෙඳ වරාය බිහිවීම, සුළු හා මහා පරිමාණ වෙළෙඳාම් කටයුතු දියණුවීම ක්‍රමයෙන් වර්ධනය වූ බව.
- උත්සව සැණකෙළි මෙන් ම සුරාසැල් ද ගණිකා වෘත්තිය වැනි කටයුතු ද ව්‍යාප්ත වූ බව.
- වෙළෙඳාමෙන් ධනය උපයාගත් වෛශ්‍යයන් වෙළෙඳ ශ්‍රේණි වශයෙන් සංවිධානය වී එහි නායකයා සිටු තත්ත්වයට පත්වූ බව.
- සංචාරක වෙළෙඳාම, පදික වෙළෙඳාම, ස්ථාවර වෙළෙඳාම, දේශීය හා විදේශීය වෙළෙඳාම සුළු, මධ්‍ය හා මහා පරිමාණ වෙළෙඳාම වශයෙන් වෙළෙඳ කටයුතු දියුණු වූ අතර වෙළෙඳුන් වෘත්තීය වශයෙන් සංවිධානගත වීම තෙක් වර්ධනය වූ බව.
- සැවැත් නුවර සිට සාකේත, කොසඹෑ, විදිසා, උදේනි හරහා එක් වෙළෙඳ මාවතක් ද සැවැත් නුවර සිට රජගහ නුවර තෙක් කපිලවස්තුව, කුසිනාරාව, විසාලාව, පැලලුප් නුවර හරහා තවත් වෙළෙඳ මාවතක් ද බරණැස සිට වේරංජාව තෙක් තවත් වෙළෙඳ මාවතක් ද වශයෙන් වෙළෙඳ මාවත් තුනක් තිබූ බව. (ලකුණු 4යි)

2. i ශ්‍රමණ සංස්කෘතියට අදාල අනන්‍යතා ලක්‍ෂණ හතරක් පෙන්වා දෙන්න.

- සත්ත්වයා හා ලෝකය පිළිබඳ ඊශ්වර නිර්මාණවාදය පිළිගත් බව.
- ඒ අනුව මහා බ්‍රහ්ම, මහා පුරුෂ සංකල්පය හා එය පදනම් කොට ගෙන නිර්මාණය කරන ලද වර්ණාශ්‍රම ධර්ම ආදිය දිව්‍යමය ප්‍රභවයක් ලෙස දැක්වූ බව.
- වේද ග්‍රන්ථ පරම සත්‍ය ලෙස පිළිගත් බව.
- යාගය, පුදසත්කාර ගීතිකා ගායනය ආදිය මුල් කරගත් කර්ම මාර්ගය ලෞකික ලෝකෝත්තර සැප පිණිස ඒකායන මාර්ගය ලෙස පිළිගත් බව.
- අගාරික ප්‍රතිපදාව පිළිගත් බව.
- පුද්ගල ස්වච්ඡන්දතාව, ස්වාධීනත්වය දේව නිර්මාණවාදයට යටපත් කළ බව.
- ජන්මීය සාධක මත පුද්ගලයා උසස් හා පහත් යනුවෙන් තීරණය වූ බව.
- කාන්තාවගේ දේශපාලන, ආර්ථික, සාමාජික, ආගමික නිදහස අහුරා තැබූ බව. (ලකුණු 4යි)

ii. සංජය බෙල්ලට්ඨිපුත්ත ශාස්තෘවරයාගේ දර්ශනය ගෙනහැර දක්වන්න.

- බ්‍රහ්මජාල සූත්‍රයට අනුව මොහුගේ ඉගැන්වීම අමරාවික්ඛේපවාදය ලෙස හැඳින්වෙන බව.
  එවන්තිපි මේ නෝ - තථාතිපි මේ - නෝ අඤ්ඤථාතිපි මේ නෝ - නෝ තිපි මේ නෝ
  නෝ නෝ තිපි මේ නෝ...... යනාදි ලෙසින් එය දක්වෙන බව
- සංජය බෙල්ලට්ඨිපුත්තගේ දර්ශනයෙන් මහජනයා වික්ෂිප්තියට (වික්ඛේපං) පත් වන බැවින් මෙය සාමඤ්ඤ ඵල සූත්‍රයේ වික්ඛේපවාදය ලෙස හැඳින්වෙන බව.
- අමරා වික්ඛේපවාදය සංසයවාදය ලෙස ද හැඳින්වෙන බව සත්ත්වයාගේ මරණින් මතු පැවැත්ම, පරලොව, කුසලාකුසල කර්මයන්ගේ ඵල විපාක ආදිය පිළිබඳ විමසන ලදුව නිශ්චිත පිළිතුරක් නො දීම සංජයගේ පිළිවෙත වූ බව. (ලකුණු 4යි)

iii. සංජයය බෙල්ලට්ඨිපුත්ත ශාස්තෘවරයාගේ දර්ශනය පිළිබඳ බුදුසමයේ ආකල්පය සංක්ෂේපයෙන් ඉදිරිපත් කරන්න.

- ප්‍රශ්නවලට නිසි පිළිතුරු නො දීම අඥේයවාදියකුගේ ලක්ෂණයක් බව.
- සංජයගේ දර්ශනය බෙහෙවින් අපැහැදිලි වූත් බුද්ධිගෝචර නොවූත් ඉගැන්වීමක් බව.
- කිනම් විමුක්තියක් පිණිස කිනම් ප්‍රතිපදාවක් වඩන්නේ දැයි අපැහැදිලි බැවින් ශ්‍රාවකයන් මුළාවට හෙළන ඉගැන්වීමක් බව.
- විචිකිච්ඡාව, සැකය, විමතිය, සංශය, විමුක්ති සාධනයෙහි ලා නීවරණය යන්න බෞද්ධ ඉගැන්වීම බව.
- සදාචාර ධර්ම සංරක්ෂණය පිණිස මෙම ඉගැන්වීමෙන් කිසි දු පිටිවහලක් නො ලැබෙන බව.
- අරමුණක් නැති, පැහැදිලි අවසානයක් නැති, ආගම දහමක් උදෙසා ප්‍රතිපදාවක් වැඩීම අනවශ්‍ය නිරර්ථක කටයුත්තක් බව. (ලකුණු 4යි)

iv. සිගාලෝවාද සූත්‍රයේ දැක්වෙන ගුරු ශිෂ්‍ය යුතකම් හා වගකීම් නම් කරන්න.

**ශිෂ්‍ය යුතුකම්**

1. ගුරුවරයා දුටුවිට හුනස්නෙන් නැගීසිටිය යුතුය. - උට්ඨානේන
2. ගුරුවරයාට අවශ්‍ය උපස්ථාන කළයුතුය. - උපට්ඨානේන
3. ගුරුබසට ඇහුම්කන් දිය යුතුය. - සුස්සූසාය
4. ගුරුවරයාට අවශ්‍ය කටයුතු ඉටුකරදිය යුතුය. - පාරිචරියාය
5. මැනවින් ඉගෙන ගත යුතුය - සක්කච්චං සිප්පටිග්ගහනේන

**ගුරු යුතුකම්**

1. ශිෂ්‍යයන් මනාව හික්මවාලිය යුතුය. - සුවිනීතං විනෙන්ති
2. ශිෂ්‍යාට මැනවින් ඉගැන්විය යුතුය. - උපට්ඨානේනසුගගහිතං ගාහාපෙන්ති
3. ගුරුවරයා දන්න සියලු ශිල්ප ශාස්ත්‍ර ශිෂ්‍යාට කියාදිය යුතුය. - සබ්බ සිප්ප සුතං සමයක්ඛායිනෝ භවන්ති
4. තම මිත්‍රයන්ට ශිෂ්‍යාව හඳුන්වාදිය යුතුය. - මිත්තාමච්චේසු පටියාදෙන්ති
5. ශිෂ්‍යා උවදුරුවලින් වළක්වා ගතයුතුය. - දිසාසු පරිත්තානං කරොති (ලකුණු 4යි)

v. සුරාපානයෙන් වැළකීමේ සමාජමය වටිනාකම පෙන්වා දෙන්න.

1. බලා සිටියදී ම ධනය විනාශවීම - සන්දිට්ඨිකා ධනඤ්ජානි
2. කළකෝළාහල වලට යොමු වීම - කලහප්පවඩ්ඪනී
3. විවිධ රෝගාබාධවලට යොමුවීම - රෝගානං ආයතනං
4. අපකීර්තියට භාජනය වීම - අකිත්ති ඤ්ජනනී
5. ලජ්ජාව නැතිවීම - කෝපීන නිද්දංසනී
6. ප්‍රඥාව දුර්වල වීම - පඤ්ඤාය දුබ්බලීකරණී (ලකුණු 4යි)

3. i. බුදුරජාණන් වහන්සේගේ මහා ප්‍රඥාව පිළිබඳ විවරණයක යෙදෙන්න.

බුදු රජාණන් වහන්සේගේ කරුණාව මහා කරුණාව වන්නා සේ ම ප්‍රඥාව මහා ප්‍රඥාව වන බව.

- විදර්ශනා ඥානය හෙවත් ලෝකයේ ඇත්ත ඇති සැටියෙන් දක්නා නුවණ ප්‍රඥාව වන අතර එය ලෝකය හා ජීවිතය පිළිබඳ ව බුදු රජාණන් වහන්සේ සතු ව පැවැති ගැඹුරු වූ නුවණ බව.
- අනුපූර්ව ශික්‍ෂාවේ තෙවන පියවර ප්‍රඥාව බව.
- මහා ප්‍රඥාවට විෂය නොවුණු කිසිවක් ලොවෙහි නැති බව
- බුදුරදුන් සතු ව පැවැති විවිධ ඥාන දර්ශනයන්ගෙන් ප්‍රඥා මහිමය ප්‍රකට වන බව.
- ත්‍රිවිද්‍යා ඥානය, අෂ්ට විද්‍යා ඥානය, සර්වඥතා ඥානය ආදී වශයෙන් එය විවිධාකාර වන බව.
- බුද්ධ ශරීරය කොතරම් දුර්වල වුව ද උන් වහන්සේගේ ප්‍රඥා ශක්තියෙහි කිසි දු වෙනසක් නොවේ යයි මජ්ඣිම නිකායේ මහා සීහනාද සූත්‍රයෙන් පැහැදිලි කෙරෙන බව.
- චුල්ල හත්ථිපදෝම සූත්‍රයේ දී පිලෝතික පරිබ්‍රාජක බුදුරදුන්ගේ ප්‍රඥාව වෙසෙසින් අගය කර ඇති බව.
- බුදුරදුන්ගේ මහා ප්‍රඥාව ආදර්ශයට ගෙන පුද්ගලයෙකුගේ මෙලොව ජීවිතය මෙන් ම පරලොව ජීවිතය ද අර්ථවත් එකක් බවට පත් කර ගැනීමටත් සසර දුකින් අත් මිදීමටත් හැකියාව ලැබෙන බව.
- බුදු රජාණන්වහන්සේගේ සෙසු ගුණාංගවලට වඩා මහා ප්‍රඥාව ශ්‍රේෂ්ඨ යයි උනවහන්සේම දේශනා කර ඇති බව. (මහා සකුළුදායි සූත්‍රය). (ලකුණු 4යි)

ii. සත්තා දේවමනුස්සානං බුදුගුණය විස්තර කරන්න.

- දෙවියන් සහිත ලෝකයාට දිට්ඨධම්මික සම්පරායික යන උභයාර්ථ සිද්ධිය පිණිස අනුශාසනා කරන බැවින් ද (සදෙවකෙ ලොකෙ සාසතීති සත්ථා) දෙව් මිනිසුන්ට ශාස්තෘවරයා මෙන් ම ගුරුවරයා වන බැවින් ද, බුදු රජාණන් වහනසේ 'සත්ථා' (සත්ථාදෙවමනුස්සානං) යනුවෙන් හැඳින්වෙන බව.
  බව කතරින් එතර - ලනුයෙන් සතන් හැම වර
  තිලෝගුරු මුනිවර - වී ය සත්තා නමින් පුවතර (ලකුණු 4යි)

iii. ආනන්ද තෙරුන් වහන්සේ නිත්‍ය උපස්ථායක ධුරය භාරගැනීමට පෙර බුදුරදුන්ගෙන් අයද සිටි ආයාචනා හතර හා ප්‍රතික්ෂේප හතර වෙන වෙන ම ඉදිරිපත් කරන්න.

**ආයාචනා :**

1 මා විසින් කරනු ලබන ආරාධනා බුදු රජාණන් වහන්සේ විසින් පිළිගත යුතු වීම.
2 පිටින් පැමිණෙන කවරකු හෝ කැමති වේලාවක බුදු රජාණන් වහන්සේ මුණ ගැස්වීමට අවසර දිය යුතු වීම.
3 කවර හෝ සැකයක් මට ඇති වූ කල්හි එකෙණෙහිම එය විචාරීමට අවසර ලැබිය යුතු වීම.
4 මා නොසිටි තැන දෙසූ ධර්මය නැවත වරක් මට දේශනා කළ යුතු වීම.

**ප්‍රතික්ෂේපඃ**

1 බුදු රජාණන් වහන්සේට ලැබෙන චීවර තමාට නොදිය යුතු බව.
2 බුදු රජාණන් වහන්සේට ලැබෙන පිණ්ඩපාතය තමාට නොදිය යුතු බව.
3 බුදු රජාණන් වහන්සේ වසන එක ම ගඳකිළියේ තමාට විසීමට ඉඩ නො දිය යුතු බව.
4 බුදු රජාණන් වහන්සේට කෙරෙන ආරාධනාවලට තමා පිටත් කර නො හැරිය යුතු බව.(ලකුණු 4යි)

සඬග ජයං වේරං පසවති යන ගාථාව සම්පූර්ණ කරන්න.
ජයං වේරං පසවති - දුක්ඛං සේති පරාජිතෝ
උපසන්තෝ සුඛං සේති - හිත්වා ජය පරාජයං (ලකුණු 4යි)

v. එහි තේරුම නිවැරදිව ලියන්න.
දිනන්නා පරදින්නා තුළ වෛරය ඇති කරයි. පරදින්නා දුකසේ වෙසේ. (රාගාදි කෙලෙසුන් කෙරෙන් මිදුණු) උපශාන්තයා ජයත්, පරාජයත් හැර සුව සේ වෙසෙයි. (ලකුණු 4යි)

## ii කොටස

4. i. පුද්ගලයා හා සමාජය අතර සබැඳියාව තහවුරු කිරීමට සිව්බඹ විහරණයන් හි පවත්නා කාලීන වැදගත්කම ඇගයීමට ලක්කරන්න.

- මෙත්තා, කරුණා, මුදිතා, උපේක්ඛා යනු සිවුබඹ විහරණ වන බව.
- බ්‍රහ්ම විහාර සියලු සත්ත්වයන් විෂයයෙහි පැතිර විය යුතු චින්තාවන් වන බව.
- ගිහිපැවිදි දෙපක්ෂය විසින් ම ශක්ති ප්‍රමාණයෙන් මෙම බ්‍රහ්ම විහාර ධර්ම ප්‍රගුණ කළ යුතු බව.
- සිවුබඹ විහරණ සීමාවකින් තොර ව වැඩිය යුතු බැවින් අප්පමඤ්ඤා නම් වන බව.
- පුද්ගලයා සමාජය අතර සබැඳියාව තහවුරු කිරීමට මෙම බ්‍රහ්ම විහාර බෙහෙවින් උපකාර වන බව එකිනෙක කරුණ සැලකිල්ලට විස්තර වියයුතුය . (ලකුණු 10යි)

ii. පරිසර සංරක්‍ෂණය පිලිබඳ බෞද්ධ ඉගැන්වීම්වල කාලීන වැදග්කම පෙන්වා දෙන්න.

- ජෛවගෝලය, වායුගෝලය, ජලගෝලය සහ පාංශුගෝලය පරිසරය සේ සැළකේ
- උක්ත සමස්ත පද්ධතිවල බරපතල ගැටලු ද මතුවී ඇති බව
- ප්‍රමාණවත් පිරිසිදු ජලය නොමැතිකමින් දිනකට දහස් ගණන් මිය යාම
- පිරිසිදු ජලයට මුත්‍රාකිරීම, මලපහ කිරීම, කෙළ ගැසීම නොකල යුතුයැයි සේඛියාවල දැක්වේ.
- නිල් තණමත මුත්‍රා කිරීම, මලපහකිරීම, කෙළ ගැසීම නොකළ යුතුය.
- පරිසර සංරක්‍ෂණය පින්වැඩෙන පින්කමක් ලෙෂ අගය කිරීම
- බීජගාම, භූතගාම, ශික්‍ෂාපදය මගින් පංචවිධ බීජ සිඳීම භික්ෂූවට තහනම් කිරීම
- මිනිසාගේ පමණක් නොව සකලවිධ සත්වයාගේ ජීවත්වීමේ අයිතිය තහවුරු කිරීම (පංච සීලය හා මෙත්තා භාවනාව)
- උඩු සුළගට ගසාගෙන යන ලෙස පාපිසි ආදිය ගසා නොදැමිය යුතුය.
- අල්පේච්ඡතාව යථාලාභ සන්තුට්ඨිය වැනි අධ්‍යාත්මික ගුණ ධර්ම පුහුණු කිරීම යන කරුනු ඇසුරු කරගෙන පිළිතුර පසකස්විය යුතුය. (ලකුණු 10යි)

5. i. ජනතාවාදී රාජ්‍ය පාලනයක් බිහිකරගැනීමෙහිලා බෞද්ධ දේශපාලන ඉගැන්වීම්වල පවත්නා සර්වකාලීන වැදගත්කම ගෙනහැර දක්වන්න.

- අග්ගඤ්ඤ සූත්‍රයට අනුව පාලකයා සහ රජය බිහිවන්නේ ජනතාවගේ ආරක්‍ෂාව හා අයිතීන් සුරක්‍ෂිතකිරීම පිනිසයි. පාලකයා රජ යන නමින් ආමන්ත්‍රනය කරණු ලැබුවේද ජනතාව සතුටට පත්කරවන බැවිනි. බෞද්ධ දේශපාලන මූලධර්ම අනුව පාලකයාගේ ප්‍රධාන වගකීම ජනතාවගේ සුභසාධනය පිලිබඳ සොයා බැලීමයි.
- ශ්‍රේෂ්ඨ පාලකයකු විසින් අනුගමනය කළයුතු පාලන මූල ධර්ම රැසක් බුදු දහමෙහි දක්වා ඇත.
- පඤ්චශිල ප්‍රතිපදාව, දසරාජ ධර්ම, දස සක්විත්වත්, සප්ත අපරිහානීය ධර්ම, සතර සංග්‍රහ වස්තු, සතර අගතියෙන් වෙන්වීම
- මෙම දේශපාලන මූලධර්ම සහ කුටදන්ත සූත්‍රය ආදී සෙසු සූත්‍රදේශනාවල අන්තර්ගත රාජ්‍ය පාලනය හා බැඳි සාරධර්ම ජනතාවාදී රාජ්‍ය පාලනයක් බිහිකරගැනීමෙහිලා හේතුවන බව (ලකුණු 10යි)

ii. සෞන්දර්ය රසාස්වාදයට බුදු දහමින් බාදාවක් නොවන බව සනිදර්ශනව පෙන්වා දෙන්න

- සෞන්දර්ය රසාස්වාදනය බුදුදහම තුළ අවතක්සේරු කර නැති බව.
- බුදුරදුන් උසස් රස වින්දනය අගය කර ඇති බව.
- බුද්ධ ශ්‍රාවක - ශ්‍රාවිකාවන් භාවනාව මගින් ලැබූ කායික හා මානසික සැහැල්ලුව ද ඇති ව නිකෙලෙස් ඇසින් සුන්දරත්වය වින්දනය කොට ඇති බව.
- ස්වභාව සෞන්දර්යය හා නිර්මාණ සෞන්දර්යය ඇගයීමට ලක් කොට ඇති අවස්ථා මූලික සූත්‍රවල පවා බහුල ව දැකිය හැකි බව.
- ඇතැම් ථෙර ගාථාවන් තුළින් සෞන්දර්ය රසාස්වාදනයෙහි යෙදුන රහතන් වහන්සේලා පිලිබඳ තොරතුරු දැක්වෙන බව
- විවේකය ධාර්මික ව ගත කිරීමේ දී උසස් කාව්‍ය, චිත්‍ර, මූර්ති වැනි කලා මාධ්‍ය මගින් සිය අත්දැකීම් සන්නිවේදනය කළ හැකි බව. (ලකුණු 10යි)

6. i. ධන පරිභෝජනය පිලිබඳ බෞද්ධ ඉගැන්වීම් සමාජ සහජීවනයට ඉවහල්වන ආකාරය පෙන්වා දෙන්න.

- බුදු සමයට අනුව ධනය වනාහි ගොඩ ගසාගත යුත්තක් නොව සංසරණය විය යුතු දෙයකි. උපයන ධනයෙන් තමාපිනවීම, දෙමව්පියන් පිනවීම, අඹු දරුවන් පෝෂණය කිරීම, හිතමිත්‍රාදීන් පිනවීම, දාසිදස් කම්කරුවන් පිනවීම, මහණ බමුණන් විෂයෙහි දක්‍ෂිණාව පිහිටුවීම
- පත්තකම්ම සූත්‍රයේ පංච බලි සංකල්පය අනුව දැහැමිව උපයන ධනය කොටස් පහකට බෙදා සමාජ යුතුකම් විෂයෙහි යෙදවිය යුතු බව
- ඒකේන භෝගේ භුඤ්ජෙය්‍ය --- යනාදි ක්‍රමයට උපයන ධනය කොටස් හතරකට බෙදා ආයෝජනය, පරිභෝජනය හා සංරක්‍ෂණය සඳහා නුවණින් යෙදවිය යුතු බව
- සිගාලෝවාද සූත්‍රයේ දැක්වෙන යුතුකම් ඉටුකිරීමට යෙදවීම
- සත්පුරුසයාගේ ධනය පස්පියුමින් සැදි සිහිල් දියපිරුණු රකුසන් අරක්නොගත් විලක් පරිද්දෙන් යහපතට හේතුවන බව අපුත්තක සූත්‍රයේ සඳහන්වීම
- සුරාව සූදුව කාමමිත්‍යාචාරය වැනි සමාජයට හානිවන දුස්චරිත සඳහා උපයාගත් සම්පත් නොයෙදවීම (ලකුණු 10යි)

ii. චතුර්විධ සුඛය පිලිබඳ බෞද්ධ ඉගැන්වීම් තෘප්තිමත් ගෘහ ජීවිතයක් සඳහා උපයෝගීවන ආකාරය විස්තර කරන්න.

- මිනිසා සුඛකාමී සත්වයෙකු බව බුදු සමය පිලිගනී
- ගිහියාට මෙන්ම පැවිද්දාට ද අනන්‍ය සැපයක් ඇත.
- බුදුරදුන් සැප පිලිබඳ ඉදිරිපත් කළ අදහසක් අංගුත්තර නිකායේ අනණ සූත්‍රයේ සඳහන්ව ඇත. අත්ථි සුඛ, භෝග සුඛ, අනණ සුඛ හා අණවජ්ජ සුඛ වශයෙන් දැක්වෙන්නේ එම සැප හතර බව
- මේ එක් එක් සැපයන් වෙන වෙන ම ගෙන අර්ථ දක්වමින් ගෘහ ජීවිතය තෘප්තිමත් කරගැනීමට උපකාරිවන අයුරුවිස්තර විය යුතුය. (ලකුණු 10යි)

7. i. පැරණි භාරතීය විශ්ව විද්‍යාල අතුරෙන් වලභි විශ්ව විද්‍යාලයට හිමිවන සුවිශේෂත්වය ප්‍රකට කරන්න .

- ක්‍රි. ව. 475 -775 කාලයේ මෛත්‍රික රජවරුන් විසින් වලභියෙහි ඉදිකළ මහා විහාරය පසුව භික්ෂූන් වහන්සේලාගේ අධ්‍යාපක ආයතනයක් බවට විකාශයවීම.
- නාලන්දා වික්‍රමශිලා ආදී සියලු භාරතීය විශ්ව විද්‍යාල මහායාන බෞද්ධ සම්ප්‍රදායට අයත්ව තිබූ අතර ඒවායේ සංස්කෘත භාෂාවට හා මහායාන බෞද්ධ ඉගැන්වීම්වලට ප්‍රමුඛත්වය ලබාදී අධ්‍යාපන ක්‍රමය සකස්වී තිබූ අතර වලභි විශ්ව විද්‍යාලය මහායාන නොවන සෙසු නිකායන්ට අයත් ප්‍රමුඛතම අධ්‍යාපන ආයතනය විය. ඒ අනුව එහි සම්මිතීය, සර්වස්තිවාද, සෞත්‍රාන්තික ආදි හීනයාන යනුවෙන් හඳුන්වන නිකායික ඉගැන්වීම් වලට ප්‍රමුකත්වය ලබාදී විෂය නිර්දේශ සකස්වී තිබුනි
- සංඝාරාම 100 කින් යුක්ත වූ අතර භික්ෂූන් වහන්සේලා 6000ක් වැඩ වාසය කර ඇත.
- ශිෂ්‍යයන්ගෙන් වැඩිපිරිසක් හීනයාන සම්මිතිය නිකායට අයත් විය.
- දේශීය මෙන්ම විදේශීය ශිෂ්‍යයන් මෙහි අධ්‍යාපනය ලැබූ බව
- විෂය මාලාවට බුද්ධ ධර්මය, හින්දු දර්ශනය, දේශපාලන විද්‍යාව, වාණිජ විද්‍යාව, කෘෂිකර්මය, ආර්ථික විද්‍යාව, චිකිත්සා විද්‍යාව ආදී ලෞකික විෂයන් ඉගැන්වූ බව
- පුස්තකාල සංවර්ධනයට රජයෙන් පිහිටුවන ලද විශේෂ සංවර්ධන අරමුදලක් පැවැති බව.
- උපාධිධරයන්ගේ නිපුණතාව රජය ඉදිරියේ ප්‍රදර්ශනය කළයුතු බව (ලකුණු 10යි)

ii. අශෝක රජතුමා විසින් සිදුකරන ලද ශාසනික මෙහෙය ඓතිහාසික සාධක ඇසුරෙන් විමසීමක් කරන්න.

- දඹදිව මධ්‍ය දේශය මූලික කොටගෙන බුදුදහම ව්‍යාප්ත කිරීමේ මෙහෙවරක නිරත වූ අශෝක රජතුමා බුදු දහමට ප්‍රමුඛස්ථානයක් පිරිනැමූ අතර තමා ද බෞද්ධයකු ලෙස කටයුතු කළ බව. (ම.ව. 13 වැනි පරිච්ඡේදය)
- සාංචි සාරානාත් යන ස්ථානයන්හි පිහිටුවා ඇති සෙල්ලිපිවල සඳහන් වන අන්දමට භේද භින්න වී සිටි භික්ෂූන් සමඟි කළ ශාසන සංශෝධනයක අවශ්‍යතාව පෙන්වාදී එය ක්‍රියාවට නැංවූ බව. (මහාවංසය, සමන්ත පාසාදිකාව, අශෝක සිරිත)
- බුදු සසුනේ චිරස්ථිතයි පැතූ ධර්මාශොක් රජු බෞද්ධ වෙහෙර විහාර අසූහාරදාහක් කරවූ බව. (අසෝක සිරිත පිටු 68)
- සාංචි ස්තූපය එතුමා විසින් ගොඩනංවන ලද ස්තූප අතුරෙන් ප්‍රධාන වන බව
- සෙල්ලිපි, පුවරු ලිපි, ටැම්ලිපි, ස්තම්භ ලිපි ආදිය මඟින් මෙන් ම ධර්ම මහා මාත්‍රවරුන් මගනී ද බුදු දහමේ එන ඉගැන්වීම් ප්‍රචාරණය කළ බව.
- අශෝක රජු විසින් පිහිටුවනු ලැබූ 13 වන ගිරි ලිපියෙන් ඔහු ධර්ම මහාමාත්‍යවරුන් පිටත් කර හරිනු ලැබූ ප්‍රදේශ පිළිබඳ ව සඳහන් කර ඇති බව. (අසෝක සිරිත පිටු 71)
- මිනිස් ඝාතන නිසා දැඩි කම්පාවට කලකිරීමට පත් අශෝක දිග්විජය අතහැර ධර්ම විජය ප්‍රතිපත්තිය අනුගමනය කරන්නට පෙලඹුණ අයුරු කාල්සි ගිරි ලිපියෙන් දක්වා ඇති බව.
- ගිරිනාර් (3) ගිරි ලිපියට අනුව රටවැසියා අතර සදාචාරය වර්ධනය කරනු සඳහා නිලධාරින් යෙදවූ අශෝක රජු ඒ සඳහා ඔවුන්ට උපදෙස් දුන් පුවත සඳහන් වන බව
- අශෝක රජු බෞද්ධයකු වුව ද අනෙකුත් ආගමිකයන්ට ද අවශ්‍ය පහසුකම් සලසා දුන් බවත් ආජීවකයන්ට ආරාම පූජා කළ පුවත බරාබර් ගුහා ලිපි තුනක සඳහන් වන අතර ගිරිනාර් (07) ගිරි ලිපියේ දක්වා ඇත්තේ සැම ආගමිකයකු කෙරෙහි ම සමානාත්මතාවක් ඇති කර ගත යුතු බව
- සංඝ සාමග්‍රිය ඇතිකොට භික්ෂු සංඝයා ප්‍රතිසංවිධානය කිරීමෙන් අනතුරු ව පැවැත්වූ තුන් වන ධර්ම සංගායනාව ද ධර්මාශෝක රජතුමාගේ ශාසනික සේවාව විදහාපාන බව
- සංගීතිය අවසානයේ මොග්ගලිපුත්ත තිස්ස මහා තෙරණුවන්ගේ උපදෙස් ඇති ව ප්‍රධාන වශයෙන් රටවල් නවයකට ධර්මදූතයන් පිටත් කර යැවූ බව.
- සිය දරු දෙදෙනා සසුන් ගත කිරීමට අශෝක රජු කටයුතු කළ බව
- ලක්දිවට උතුම් බුදු දහම හඳුන්වා දුන් මිහිඳු මහ රහතන් වහන්සේ සහ ශ්‍රී මහා බෝධිය වැඩම කළ සංඝමිත්තා මහ රහත් තෙරණිය ද අශෝක රජුගේ දරුවන් දෙදෙනා වන බව (ලකුණු 10යි)

8. I. බුද්ධකාලීන ධර්ම ප්‍රචාරක සේවාවේ සාර්කත්වය උදෙසා ශ්‍රාවක සංඝයාගෙන් ඉටු වූ මෙහෙය අගයන්න.

- ප්‍රථම රහත් හැට නම ධර්ම ප්‍රචාරයේ වැඩමවීමෙන් උපතිස්ස, කෝලිත වැනි පිරිස් සසුනට එක්වීම
- මහා කච්චායන හිමි - අවන්තියේ ධර්ම ප්‍රචාරය කිරීම මගින් විවිධ පුද්ගලයින් බුදුසසුනෙහි පැවිදිවීමට කැමැත්ත පළකිරීම
- පිණ්ඩෝල භාරද්වාජ හිමි - උදේන රජු පැහැදවීම
- රෞද්‍ර මිනිසුන් සිටින සුනාපරන්ත දේශයට වැඩම කළ පුණ්ණ තෙරුන් ධර්ම ප්‍රචාරය කිරීම
- භික්ෂූන් වහන්සේලා භාරතයේ විවිධ ප්‍රදේශවල ධර්ම ප්‍රචාරයේ නිරතවීම නිසා ඒ ඒ ජනපදයන්හි දිසාවන්හිදී පැවිදි උපසම්පදාව ලබාදීමට තීරණය කිරීම
- භික්ෂුවගේ අධ්‍යාත්මික ගුණවගාව මෙන්ම අධ්‍යාත්මික ශික්ෂණයද බුදු දහම සීඝ්‍රයෙන් ව්‍යාප්තවීම කෙරෙහි බලපෑම, සැහැල්ලු දිවි පැවැත්ම, සංවර ක්‍රියා ඇති බව, අල්ප කටයුතු ඇති බවලද දෙයින් සතුටුවීම, දමුණු ඉඳුරන් ඇති බව, විවිධ ඍද්ධිමය දක්ෂතා ඇතිබව
- මහා ප්‍රජාපතී ගෝතමිය සමග පැවිදි වූ ශාක්‍ය වංශික කුමාරිකාවන් 500 නමක් ශාසනයේ ව්‍යාප්තිය සඳහා දායකවම
- මහාප්‍රජාපතී, ඛේමා, උප්පලවණ්ණා පටාචාරා ආදී භික්ෂුණීන්ගේ ක්‍රියා කලාප (ලකුණු 10යි)

ii ද්විතීය ධර්ම සංගායනාව ශාසන ඉතිහාසයේ සන්ධිස්ථායක් සනිටුහන් කරන්නේ කවර හෙයින්දැයි පරීක්ෂා කරන්න.

- මූලාශ්‍රය අනුව විශාලා මහනුවර වජ්ජිපුත්තක භික්ෂූන් ඉදිරිපත්කළ දස වස්තුව පිලිබඳ මතවාදයක් ඇතිබව
- ශාසනභාරධාරී භික්ෂූන් විනය සසුනේ ආයුෂ ලෙස සලකා විනයවාදීව කටයුතු කරද්දී සමහර භික්ෂූන් කාලය දේශය අනුව කුඩා ශික්ෂාපද වෙනස් කිරීමට පෙළඹීම
- දස වස්තුව නව නීති පද්ධතියක් ලෙස පිළිගැනීමට ගත් තීරණය ප්‍රතික්ෂේප කිරීම
- සියවසකට අධික කාලයක් එකම සංස්ථාවක් ලෙස පැවැති සංඝ සංවිධානය කොටස් වලට බෙදී යන්නේ මෙම සංගීතියෙන් පසුවය.
- පාළි මූලාශ්‍රය අනුව දෙවන සංගායනාවෙන් පසුව දස වස්තුව පිළිගත් භික්ෂූන් නෙරපා හරින ලදී. එහෙත් වෙනත් මූලාශ්‍රය වල දක්වෙන්නේ තම කැමැත්තේන වෙන් වූ බවයි. එසේ වෙන් වූ දස දහසක් භික්ෂු පිරිස ප්‍රාදේශීය පාලකයෙකුගේ අනුග්‍රහයෙන් විශාලා මහනුවර වෙනත් ප්‍රදේශයක මහා සංගීති නමින් වෙනම සංගායනාවක් පවත්වන ලදී.
- මෙසේ ආරම්භවන නිකාය භේදය පසුකාලීනව මහා සාංඝික වශයෙන් නිකාය 18 කට බෙදී ගියබව වාර්තාවේ.
- දෙවන සංගායනාවෙන් පසු ඇරඹෙන මහා සාංගික නිකාය විසින් බෝධිසත්ව සංකල්පය වර්ධනය කිරීම
- දෙවන සංගීතිය ශාසන ඉතිහාසයේ ඉතාවැදගත් සන්ධිස්ථායක් වන්නේ එය නිකාය භේදයේ ආරම්භය නිසාය. සංඝ සංස්ථාව නිකාය වශයෙන් බෙදීයාම භාරතය තුළ පමණක් නොව ලෝකය පුරා බුදුසමය ව්‍යාප්තවීමෙහිලා බෙහෙවින් ඉවහල්විය. දෙවන සංගීතියෙන් පසු වෙන් ව ගිය භික්ෂූන් මහා සාංඝික නිකාය පිහිටුවාගත් අතර දේවවාදී නිර්මාණවාදී ආගමික පරිසරයක් තුළ බුදුසමයේ පැවැත්ම උදෙසා බුද්ධ බෝධිසත්ව සංකල්ප සංවර්ධනය කළහ. භක්තිවාදය දියුණු කරගෙන පසුකාලීනව මහායාන දහම සංවර්ධනය විය. එය උතුරු දිග බුදුදහම ලෙසින් භාරතයේ පමණක් නොව ඇෆ්ගනිස්ථානය මධ්‍යාසියාව බෝටානය චීනය ටිබටය කොරියාව ජපානය ආදී සුවිශාල භෞගෝලීය ව්‍යාප්තියක් මෙමගින් සිදුවිය. (ලකුණු 10යි)